කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
අධ්‍යාපන පීඨය
අධ්‍යාපනවේදී (III) විභාගය
දෙවන සෙමෙස්තරය – 2018
පුස්තකාල හා තොරතුරු කළමනාකරණය (LIM 411)
දෙවන කොටස

(කාලය පැය 2 විනාඩි 30)

ප්‍රශ්න හතරකට (04) පිළිතුරු සපයන්න.

1.
   i. තොරතුරු විද්‍යා විෂය ක්ෂේත්‍රයට අනුව ඉගෙනුම යනු කුමක්ද යන්න පැහැදිලි කරන්න. (ලකුණු 08 )

   ii. තොරතුරු සාක්ෂරතාව කරා ළඟා වීමට ඉගෙනුම් ක්‍රියාවලිය සකසා ගත යුතු ආකාරය කෙටියෙන් විග්‍රහ කරන්න. (ලකුණු 12 )

2. 'ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ කේන්ද්‍රය පාසල් පුස්තකාල ඉගෙනුම් සම්පත් මධ්‍යස්ථානයයි.' මෙම ප්‍රකාශය විභාග කරන්න. (ලකුණු 20)

3. සෙවුම් යන්ත්‍ර භාවිතයෙන් තොරතුරු ගවේෂණයේ දී, ඒ පිළිබඳව ජ්‍යෙෂ්ඨ ද්විතියික අවධියේ ශිෂ්‍ය ප්‍රජාව තුළ තිබිය යුතු දැනුවත්භාවය පිළිබඳ රචනයක් ලියන්න. (ලකුණු 20)

4.
   i. පාසල් පුස්තකාල එකතු සංවර්ධනය සඳහා විෂයමාලා සිතියමක් සකසන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10)

   ii. එය සාර්ථකව සැකසීමට විෂයභාර ගුරුවරයාගේ සහ පුස්තකාලයාධිපතිගේ සහයෝගීත්ව භූමිකාව සහාය වන අයුරු සාකච්ඡා කරන්න. (ලකුණු 10)

5. පර්යේෂකයන් සඳහා තොරතුරු මූලාශ්‍රයක් ලෙස ශ්‍රී ලංකා ජාතික ග්‍රන්ථ නාමාවලියෙහි වැදගත්කම ඇගයීමට ලක් කරන්න. (ලකුණු 20)

6. 'චිත්‍රපටය, ඵලදායී ඉගැන්වීම් සහ ඉගෙනුම් මූලාශ්‍රයක් ලෙස භාවිත කළ හැකිය.' ප්‍රජානන හා ආවේදන දෘෂ්ටිකෝණවලින් මෙම ප්‍රකාශය විග්‍රහ කරන්න. (ලකුණු 20)

7. පහත දැක්වෙන මාතෘකා හතරක් (04) පිළිබඳ කෙටි සටහන් ලියන්න. (ලකුණු 20)
   i. විෂය ප්‍රවේශ
   ii. වෙබ් පරිණාමය
   iii. සමාජ මාධ්‍ය
   iv. ගැඹුරු වෙබ් අඩවි
   v. වෙබ් ලිපිනයක ව්‍යුහය